**ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ අදියර 1 බී ව්‍යාපෘතිය (ගිවිසඅ) - 2013**

---

ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ අදියර 1 බී ව්‍යාපෘතියේ (ගිවිසඅ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල අතර 2011 දෙසැම්බර් 20 දින එළඹි අංක 836 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ප්‍රාදේශීය හා ජාතික අවශ්‍යතා එකී විශ්ව විද්‍යාලයෙන් පිළිඹිබු වන පරිදි උපාධි පාඨමාලා වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම මෙන්ම සුදුසු අධ්‍යාපන සංවර්ධන සැලැස්ම හා නව අවශ්‍යතාවයන්ට සරිලන උපාධි වැඩසටහන් වැඩි දියුණු කිරීම තුළින් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම මගින් ශ්රී ලංකාවේ සමාජ සංවර්ධනයට හා ආර්ථික වර්ධනයට උපකාරී වීමට ඉලක්ක වන ශ්‍රී ලංකාවේ අම්පාර දිස්ත්‍රික්කයේ අග්නිදිග දිග විශ්ව විද්‍යාලය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. සංවර්ධන සැලැස්ම ප්‍රධාන වශයෙන්, පවතින ගොඩනැගිලි වලට වඩා ගංවතුර අවදානමට නැඹුරු නොවූ ප්‍රදේශ වල පවතින වැඩ බිම් වල පිහිටි නව පීඨ ගොඩනැගිලි, පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක්, ශිෂ්‍ය හා ආචාර්ය මණ්ඩල නවාතැන් පහසුකම්, විනෝද හා සුභසාධක පහසුකම් සපයයි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 1,812 ක් වන අතර ඉන් රු.මිලියන 1,421 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 3 ක් අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ශ්‍රී.ලං.ර. හී දායකත්වය රු.මිලියන 391 ක් විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 සැප්තැම්බර් 01 ආරම්භ කළ අතර 2015 දෙසැම්බැර් 31 දින අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී . ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3.** **මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**4.1** **මූල්‍ය කාර්යසාධනය**

---------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට සහ ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 20,174,124 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 29,953,484 ක් විය.සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| උපදේශන | | | |
| -දේශීය | 8,979,900 | 9,779,360 | 18,759,260 |
| -විදේශීය | 1,772,511 | - | 1,772,511 |
| ස්ථාවර වත්කම් | | | |
| -කාර්යාල උපකරණ | 12,640 | - | 12,640 |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම් | 9,409,073 | - | 9,409,073 |
| එකතුව | 20,174,124 | 9,779,360 | 29,953,484 |

**5. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

5.1 අරමුදල් උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවට අනුව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ වියදම් ශීර්ෂ 171 යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා රු. 100,000,000 ක ප්‍රතිපාදනයක් සලසා දී තිබුණි.ප්‍රතිපාදනය සහ ඒ සඳහා දැරූ තත්‍ය වියදම හා අරමුදල් ඌන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වියදම් ශීර්ෂයේ විස්තර | 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදනය | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජන කළ මුදල | ඌන උපයෝජිත මුදල | ඌන උපයෝජිත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| විදේශ ආධාර-ණය | 15,000,000 | 1,772,511 | 13,227,489 | 88 |
| ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ආධාර- ණය | 15,000.000 | 8,979,900 | 6,020,100 | 40 |
| විදේශ ආධාර හා සම්බන්ධ දේශීය අරමුදල් | 70,000,000 | 9,421,713 | 60,578,287 | 86 |

(ආ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ණය උපයෝජන අනුපාතය ණය ගිවිසුමේ දින සිට වසර දෙකක් ඉකුත්වීමෙන් පසුවද සියයට 1.78 ක් වැනි අඩු වටිනාකමක පැවතුණි. අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2013 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිලිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| | **ණය ගිවිසුම අනුව ලබාදීමට එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය** | **2013 දෙසැම්බර් 31 ට අරමුදල් උපයෝජනය** | |
|---|---|---|---|---|---|
| | **කුවේට් ඩිනාර් (මිලියන)** | **රු. (මිලියන)** | **රු.(මිලියන)** | **කුවේට් ඩිනාර් (මිලියන)** | **රු. (මිලියන)** |
| කුවේට් අරමුදල | 3.00 | 1,421.57 | 10.75 | 0.04 | 20.53 |
| ශ්‍රී.ලං.ර | 0.36 | 391.09 | 9.42 | 0.02 | 9.42 |
| | 3.36 | 1,812.66 | 20.17 | 0.06 | 29.95 |

## 5.2 භෞතික ප්‍රගතිය

ණය ගිවිසුමේ ඇති ප්‍රතිපාදනයන්ට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් 2012 මාර්තු 19 දින ආරම්භ කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් එම ක්‍රියාකාරකම් ආරම්භ කර තිබුණේ 2012 සැප්තැම්බර් 01 දිනදීය. ප්‍රගති වාර්තාවලට අනුව, ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශක වැඩ වල සියයට 35 ක ප්‍රගතියක් පෙන්නුම් කර තිබු අතර සිවිල් ඉදිකිරීම් කටයුතුවල කිසිදු ප්‍රගතියක් වාර්තා නොවීය.